දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாய"
பத்தரமுல்லை.
"Isurupaya"
Battaramulla.
පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව

ඔබේ අංකය / உமது இல. / Your No. : ..............................

මගේ අංකය / எமது இல. / My No. : ED/01/12/10/11..........

දිනය / திகதி / Date : ......2008.09..................

**චක්‍රලේඛ අංක : 2008/37**

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
රජයේ පාසල්වල ප්‍රධානීන් වෙත

## 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණි දක්වා සිසුන් ඇතුළත් කිරීම

පාසල්වලට ළමයින් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර ඇති 2006.05.23 දිනැති අංක 2006/20 චක්‍රලේඛයේ 1 කොටස හි 1.2 හා 1.3 විධිවිධානයන් සහ 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා (6 ශ්‍රේණිය හැර) පංතිවලට සිසුන් ඇතුළත් කිරීමට අදාළ කොටස හා 6 වන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමට අදාළ කොටස අභිබවා මෙම චක්‍රලේඛයේ උපදෙස් 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ළමයින් ඇතුළත් කිරීමේ දී බලපානු ඇත.

### 2.0 පන්තියක උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව හා ශ්‍රේණියේ පන්ති සංඛ්‍යාව

2.1 ඉහත සඳහන් ශ්‍රේණිවලට සිසුන් ඇතුළත් කිරීමේ දී පන්තියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව පහත සඳහන් පරිදි විය යුතුය.

අ). 2 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා පංතිවල ශිෂ්‍ය සංඛ්‍යාව පළමුවන ශ්‍රේණියට ඇතුළත්වන අවස්ථාවේ දී එම පංතියට ඇතුළත් කළ උපරිම ශිෂ්‍ය සංඛ්‍යාවට සීමා කළ යුතුය. දැනටමත් එම සිසුන් සංඛ්‍යාව ඉක්මවා ගොස් ඇත්නම් එම පන්තිවලට අලුතින් සිසුන් ඇතුළත් නොකළ යුතුය.

උදා : 2007 හා ඊට පෙර වර්ෂවල පළමු ශ්‍රේණියට ඇතුළත් වූ සිසුන් සිටින පංතිවල ශිෂ්‍ය සංඛ්‍යාව 40 ට සීමා විය යුතුය. එම සීමා ඉක්මවා ඇත්නම් අලුතින් ඇතුළත් නොකළ යුතුය.

ආ). 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා එක් පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාව 45 කට සීමා කල යුතු අතර දැනටමත් එම පන්තිවල සිසුන් සංඛ්‍යාව 45 හෝ 45 ඉක්මවා සිටී නම් එම පන්තිවලට අලුතින් සිසුන් ඇතුළත් නොකල යුතුය.

2.2 (අ) පාසලක සමාන්තර පන්ති සංඛ්‍යාව ශ්‍රේණියෙන් ශ්‍රේණියට එක සමානවිය යුතුය. එනම් 01 ශ්‍රේණියේ සිට 05 ශ්‍රේණිය දක්වා එක හා සමාන සමාන්තර පංති සංඛ්‍යාවක් ද 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා එක හා සමාන සමාන්තර පංති සංඛ්‍යාවක් ද ශ්‍රේණියෙන් ශ්‍රේණියට තිබිය යුතුය.

උදා:-

i. පළමුවන ශ්‍රේණියේ සමාන්තර පන්ති 03 ක් තිබේ නම් 2,3,4 හා 5 ශ්‍රේණිවල ද සමාන්තර පංති 03 බැගින් තිබිය යුතුය.

ii. 6 ශ්‍රේණියේ සමාන්තර පන්ති 06 ක් තිබේ නම් 7,8,9,10 හා 11 ශ්‍රේණිවල ද සමාන්තර පංති 06 බැගින් තිබිය යුතුය.

(ආ) එසේ වුවද දැනට ක්‍රීඩා පාසල් වශයෙන් නම් කර ඇති පාසල්වල පමණක් අදාළ චක්‍රලේඛයට අනුකූලව ක්‍රීඩා කටයුතු සඳහා සුදුසුකම් ලබන සිසුන් වෙනුවෙන් එක් පන්තියක් 8 ශ්‍රේණියේ දී ආරම්භ කළ හැකිය. මේ අයුරින් පන්තියක් වැඩි කරන්නේ නම් ඒ පන්තිය සමග ඇතිවන සමාන්තර පන්ති සංඛ්‍යාව 11 ශ්‍රේණිය දක්වා පවත්වා ගෙන යා යුතුය.

(ඇ) කවර හේතුවක් නිසා හෝ අමතර සමාන්තර පන්ති සංඛ්‍යාව වැඩි නොකළ යුතුය.

## 3.0 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා (6 ශ්‍රේණිය හැර) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම

3.1 පාසලක පන්තියක/පන්තිවල පුරප්පාඩු පවතින්නේ නම් පහත සඳහන් සුදුසුකම් ලබන සිසුන්ට පමණක් පාසල් ලබා දිය යුතුය.

(අ) පෞද්ගලික වාසස්ථානයෙන් බැහැරව වාසය කිරීමට සිදු වන පාර්ලිමේන්තුවට තේරී ඇති නියෝජිතයින්ගේ දරුවන්

(ආ) තම රාජකාරි අවශ්‍යතා මත කි.මී.50 ට වඩා වැඩි දුරක සිට ස්ථාන මාරුවීමක් ලබා පෙර සේවා ස්ථානයේ පිහිටි ප්‍රදේශයෙන් නව සේවා ස්ථානය පිහිටි ප්‍රදේශයට තම පවුලේ සාමාජිකයන් සමග පදිංචියට පැමිණ සිටින රජයේ/සංස්ථා/රාජ්‍ය බැංකු නිලධරයන්ගේ දරුවන්

(ඇ) පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති විදේශගතව සිට නැවත පැමිණ පාසල පිහිටි ප්‍රදේශයේ පදිංචි වන දෙමාපියන්ගේ දරුවන්.

i රජයේ අවශ්‍යතා මත ශිෂ්‍යත්ව හෝ අධ්‍යාපන කාර්ය සඳහා තම දරුවන් ද සමග වසරකට නොඅඩු කාලයක් විදේශගතව සිට තම දෙමව්පියන් සමග ආපසු පැමිණි දරුවන්

ii පෞද්ගලික අවශ්‍යතා මත වසරකට වැඩි කාලයක් විදේශගතව සිට තම දෙමාපියන් සමග ආපසු පැමිණෙන දරුවන් (විදේශ රැකියා හෝ වෙනත් කටයුතු සඳහා දෙමාපියන් සමග නිවාඩු අනුමත කරගෙන විදේශගත වන සිසුන් සඳහා ක්‍රියාත්මක අදාළ චක්‍රලේඛ අනුව කටයුතු කෙරේ).

(ඈ) තම රාජකාරි අවශ්‍යතා මත කි.මී.50 ට වඩා වැඩි දුරක සිට ස්ථාන මාරුවීමක් ලබා පෙර සේවා ස්ථානය පිහිටි ප්‍රදේශයෙන් නව සේවා ස්ථානය පිහිටි ප්‍රදේශයට තම පවුලේ සාමාජිකයන් සමග පදිංචියට පැමිණ සිටින පෞද්ගලික සේවයේ යෙදෙන නිලධරයන්ගේ දරුවන්
(පදිංචිය වෙනස්වීම හා ස්ථාන මාරුවීම නිවැරදිව තහවුරු කළ යුතුය.)

(ඉ) යම්කිසි හේතුවක් නිසා පෙර පදිංචි ස්ථානයේ සිට කි.මී.50 ට වඩා වැඩි දුරක තම පවුලේ සාමාජිකයින් සමග පදිංචිය වෙනස් කර ඇති දෙමාපියන්ගේ දරුවන්
(මෙහිදී තම පදිංචි ස්ථානය වෙනස් කිරීමට හේතු පැහැදිලිව සනාථ කළ යුතුය.)

### 3.2 ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීම

(අ) සිසුන් ඇතුළත් කිරීම සඳහා දෙමාපියන් විසින් අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ මෙම චක්‍රලේඛයේ උපලේඛණ අංක.01 ට අනුව ඇතුළත් කිරීමට කැමැත්ත ඇති පාසලේ විදුහල්පති වෙතට ය. අයදුම් කිරීමේදී තමන් කැමති පාසල් 04 ක් ප්‍රමුඛතා අනුව පිළිවෙලින් සඳහන් කළ යුතු අතර එම පාසල්වලට ද වෙන වෙනම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුය.

(ආ) ඉහත (අ) අනුව ඉල්ලුම් කරන ලද අයදුම්කරුවන් පාසලේ පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි වන්නේ නම් පමණක් තෝරාගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පහත සඳහන් අයුරින් පිහිටුවා ගත යුතු ය.

i. අදාල පාසලේ විදුහල්පති
ii. අදාළ පාසලේ නියෝජ්‍ය විදුහල්පතිවරයෙක් හෝ ජ්‍යෙෂ්ඨ ගුරුවරයෙක්
iii. පාසලේ අදාළ අංශ ප්‍රධානියා

(ඇ) මෙම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපති ලෙස විදුහල්පති කටයුතු කරනු ඇත.

(ඈ) ඉල්ලුම් කරන ලද සිසුන් පාසල්වලට තෝරා ගැනීම සඳහා ඉහත සඳහන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් වර්ෂයකට සිව් වරක් එනම්, පෙබරවාරි, මැයි, අගෝස්තු හා නොවැම්බර් මාසයන් හි අවසාන සතියේ සම්මුඛ පරීක්ෂණ පැවැත්විය යුතු ය.

(ඉ) පාසලට ලැබී ඇති අයදුම්පත් පාසලේ පංතිවල පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි වන්නේ නම් පමණක් සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සඳහා විදුහල්පති විසින් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු ය.

(ඊ) පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩුවෙන් අයදුම්පත් ලැබෙන පාසල්හි විදුහල්පතිගේ නිර්දේශය මත කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව අයදුම්පත් ඉදිරිපත් කළ සියළුම අයදුම්කරුවන් පාසලට ඇතුළත් කර ගත හැකිය

3.3 ශිෂ්‍යයා ඉල්ලුම් කරන පාසල ලබාදීමට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ බැඳී නැතත් ඔහුට එම කලාපය තුළ පාසලක් ලබාදීමට කටයුතු කළ යුතු ය.

## 3.4 තෝරා ගැනීමේ ක්‍රමවේදය

(අ) 2 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවලට ඇතුළත්වීමට බලාපොරොත්තු වන සිසුන් සම්මුඛ පරීක්ෂණයේදී පෙර සිටි පාසලේ දක්වන ලද අධ්‍යාපන ප්‍රගතිය හා විශේෂ දක්ෂතා සලකා බලන අතර ඇතුළත්වීමට බලාපොරොත්තු වන පාසලට සමාන පහසුකම් සහිත පාසලක ඉගෙනුම ලැබුවේද යන්න ද සළකා බැලිය යුතුය.

(ආ) 7 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන් ඇතුළත් කිරීමේ සම්මුඛ පරීක්ෂණයේ දී පහත කරුණු සළකා බලනු ලැබේ.

i. 5 ශ්‍රේණි ශිෂ්‍යත්ව විභාගයේ දී සිසුවා ලබාගත් ලකුණු
ii. අදාළ දරුවා ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි වර්ෂයේ දී අදාළ පාසල් සඳහා තීරණය වූ අවම ලකුණ
iii. ඇතුළත්වීමට බලාපොරොත්තුවන පාසල, දැනට ඉගෙනුම ලබන පාසලට සමාන පහසුකම් සහිත පාසලක්ද යන්න සලකා බැලීම
iv. ඔහුගේ වර්තමාන අධ්‍යාපන ප්‍රගතිය හා දක්ෂතා

(ඇ) 5 ශ්‍රේණි ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි වර්ෂයේ දී ඉල්ලුම් කරන පාසල සඳහා තීරණය වූ අවම ලකුණු සංඛ්‍යාව හෝ ඊට වඩා වැඩි ලකුණු ලබා ඇත්නම් එම සිසුන් ප්‍රථමයෙන් තෝරා ගත යුතු ය.

(ඈ) අදාළ වර්ෂයේ එම පාසලට තීරණය වූ අවම ලකුණට වඩා වැඩි ලකුණු ලබා ගත් සිසුන් අදාළ පංතියේ පුරප්පාඩු සංඛ්‍යාවට වඩා සිටී නම් ලකුණු අනුපිළිවෙල මත පෙළ ගස්වා ඉහළ සිටින සිසුන් තෝරා ගත යුතු ය.

(ඉ) වඩා වැඩි ලකුණු ලබාගත් සිසුන් තෝරා ගැනීමෙන් පසු තවදුරටත් පංතියේ පුරප්පාඩු පවතී නම් ඊට අදාළ වර්ෂයේ පාසලේ අවම ලකුණට වඩා අඩු ලකුණු ලබා ගත් සිසුන් 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් ලබා ගන්නා ලකුණු අනුව පෙළ ගස්වා ඉහත (ආ) හි iii හා iv කරුණුද සැළකිල්ලට ගෙන එම සිසුන් තෝරා ගත යුතු ය.

(ඊ) විදේශගතව සිට පැමිණෙන සිසුන් ලංකාවේ දී 5 ශ්‍රේණි ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිට ඇත්නම් එම ලකුණු මතද එම විභාගයට පෙනී සිට නොමැති නම් යථෝක්ත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් සිසුවා සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඔහුගේ/ඇයගේ අධ්‍යාපන ප්‍රගති වාර්තා, විශේෂ දක්ෂතා හා වයස සලකා බලා පාසලක් ලබාදීම තීරණය කළ යුතු ය.

(උ) යම් හේතුවක් නිසා 5 ශ්‍රේණි ශිෂ්‍යත්ව පරීක්ෂණයට පෙනී නොසිටි සිසුන් සඳහා ඔවුන් සිටි පාසලේ ප්‍රගති වාර්තාව, වෙනත් දක්ෂතා පිළිබඳ වාර්තා හා ඇතුළත් වීමට බලාපොරොත්තු වන පාසලට සමාන පහසුකම් සහිත පාසලක ඉගෙනුම ලැබුවේ ද යන්න සලකා බැලීම සඳහා යථෝක්ත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වා තෝරා ගැනීම සිදුකළ යුතුය.

(ඌ) ඉහත අයුරින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඔවුන්ගේ සනාථ වන සුදුසුකම් අනුවත් පාසලේ පවතින පුරප්පාඩු අනුවත් ඇතුළත් කිරීමට

සුදුසුකම් ලබන සිසුන් අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති අදාළ පදිංචි ස්ථානයේම පදිංචිව සිටිද යන්න සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් පරීක්ෂා කර බලා තහවුරු කරගත යුතු ය.

(එ) යම් අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු සාවද්‍ය බව ඔප්පු වුවහොත් එම අයදුම්කරු තෝරා නොගැනීමටද / ඉවත් කිරීමටද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට බලය ඇත.

(ඒ) පාසලේ පවතින පුරප්පාඩු අනුව තෝරා ගැනීමට සුදුසුකම් ලබන සිසුන්ගේ නම් හා ඔවුන් දැනට ඉගෙනුම ලබන පාසල සඳහන් ලේඛණයක් සකස් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සියළුම සාමාජිකයින් එහි අත්සන් තැබිය යුතුය. ඉන් පසුව ජාතික පාසලක් නම් අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතියට ද පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතියට ද ඉදිරිපත් කළ යුතු ය. එම ලේඛන සමග සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අපේක්ෂකයන් ලබා ගත් සුදුසුකම් පිළිබඳ විස්තර ද සමාන්තර පන්තිවල ශිෂ්‍ය සංඛ්‍යා විස්තරය ද ඉදිරිපත් කළ යුතු ය.

3.5 **ආසන්න අවුරුදු 03 ක් ඇතුළත අවම ලකුණු තීරණය වූ 6 ශ්‍රේණියට ශිෂ්‍යත්වධාරීන් ඇතුළත් කරනු ලබන පාසල්වල 5 ශ්‍රේණියට සිසුන් අතුළත් කිරීම කිසිසේත්ම නොකළ යුතුය.**

3.6 ඉහත 3.1 වගන්තියට අනුව සුදුසුකම් ලබන සිසුවෙකුට එම සුදුසුකම් මත මීට පෙර පාසලක් ලබා දී ඇත්නම් එම සිසුවාම නැවත පාසලක් ඉල්ලා සිටියේ නම් ලබා නොදිය යුතු ය.

## 4.0 හයවන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම.

4.1 තම පාසලේ සිසුන් හා පෝෂිත පාසල්වලින් ඇතුළත් වන සිසුන්ට අමතරව 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්වධාරීන් පාසල්වල 6 ශ්‍රේණියට ඇතුළත් කිරීම පිළිබඳ සියලු විධිවිධාන මෙම අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් පමණක් සිදු කරනු ලබන බව අවධාරණය කරනු ලැබේ.

4.2 මෙහිදී සුදුසුකම් ලද සිසුන්ගෙන් ලැබෙන අයදුම්පත්‍ර පරිගණකගත කිරීමෙන් අනතුරුව අදාල විද්‍යාලවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව එම විද්‍යාලවලට ඉල්ලුම් කර ඇති ඉල්ලුම්කරුවන්ගේ ලකුණු අනු පිළිවෙල මත ඒ ඒ පාසලට අවම ලකුණක් තීරණය වේ. එසේ තීරණය වූ අවම ලකුණට අනුව පාසල් සඳහා තෝරා එවනු ලබන සියළුම සිසුන් එම විද්‍යාලවලට ඇතුළත් කරගත යුතු වේ.

4.3 එසේ යොමු කරන ලද සිසුන් ඇතුළත්වීමෙන් පසුව හෝ ඇතුළත්වීමට පෙර කිසියම් හේතුවක් මත එම පාසලට යාමට නොහැකි හෝ අපහසුතා ඇත්නම් තමන්ට සුදුසු පාසලක් ලබා ගැනීම සඳහා එම සිසුන්ගේ දෙමාපියන් විසින් අභියාචනාවක් එම පාසලට ඇතුළත් කර ගැනීමට කැඳවූ දින සිට මසක කාලයක් ඇතුළත දී අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ හැකිය.

4.4 එසේ ඉදිරිපත් කරන ලද අභියාචනා මගින් සිසුන්ට පාසල් ලබා දීමට හැකි වන්නේ ඉල්ලුම්කරන පාසලේ පුරප්පාඩු ඇති වුවහොත් හා එම පාසලේ අවම ලකුණට සිසුවා ලබාගත් ලකුණු වැඩි හෝ සමාන වුවහොත් පමණි. එහෙත් පාසලේ පුරප්පාඩු තිබියදී පාසලේ අවම ලකුණු හෝ අවම ලකුණට වඩා වැඩි ලකුණු ලබාගත් සිසුන් නොසිටියේ නම් අවම ලකුණට අඩු ලකුණු ද ලකුණු ප්‍රමුඛතා අනුව සලකා බලනු ඇත. (ශිෂ්‍යත්ව සුදුසුකම් ලැබූ සිසුන් ගෙන් පමණි)

4.5 තම විද්‍යාල වෙත යොමු කරන ලද ශිෂ්‍යත්වධාරීන් ඇතුළත් කර ගැනීමට කැඳවූ දින සිට සති 02 කින් පසු යොමු කරන ලද ශිෂ්‍යත්වධාරීන් අතරින් ඇතුළත් වූ සිසුන්, ඇතුළත් නොවූ සිසුන් හා තවදුරටත් ඇතුළත් කර ගැනීමට හැකි සිසුන් සංඛ්‍යාව පිළිබඳ සවිස්තර වාර්තාවක් ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ, පාසල් කටයුතු ශාඛාවේ, අධ්‍යාපන අධ්‍යක්ෂ, වෙත ඉදිරිපත් කිරීමට විද්‍යාලපතිවරුන් විසින් වග බලාගත යුතු වේ.

4.6 පස්වැනි ශ්‍රේණි ශිෂ්‍යත්වධාරීන් ඇතුළත් කරනු ලබන පාසල්වල, නම් කරන ලද පෝෂිත පාසල් තිබේනම් එම පාසල්වල සිසුන් ද, ශිෂ්‍යත්වධාරීන්ගේ ප්‍රධාන ලේඛණයේ සිසුන් ද අභියාචනා සිසුන් ද ඇතුළත් කිරීමෙන් පසුව පාසල්වල 6 වන ශ්‍රේණියේ තවදුරටත් පුරප්පාඩු පවතින්නේ නම්, එකී පුරප්පාඩු පිරවීම සඳහා විද්‍යාලපති විසින් ඉල්ලුම්පත් කැඳවීම කළ යුතු ය. පාසලට ඉදිරිපත් කෙරෙන ඉල්ලුම්පත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද අදාළ වර්ෂයේ 5 ශ්‍රේණි ශිෂ්‍යත්ව විභාගයේ දී ඒ ඒ සිසුන් ලබා ගත් ලකුණු ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව පෙළ ගස්වා පුරප්පාඩු සංඛ්‍යාව ද පැහැදිලිව සඳහන් කොට පාසලට තෝරා ගත හැකි සිසුනට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ (ජාතික පාසලක් නම් මෙම අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ) අනුමැතිය වාර්ෂිකව ලබා ගත යුතු ය.

4.7 අනුමැතියට ඉදිරිපත් කරන ලේඛණය පහත සඳහන් ආකෘතියට අනුව ලකුණු ප්‍රමුඛතා අනුව සකස් කර තිබිය යුතු ය.

පාසලේ නම :
පුරප්පාඩු සංඛ්‍යාව :

| අනු අංකය | විභාග අංකය | නම හා ලිපිනය | ලකුණු (ප්‍රමුඛතා අනුව) |
|---|---|---|---|
| | | | |

.................................

විදුහල්පතිගේ අත්සන

4.8 රජයේ සේවකයන් පාසල පිහිටි ප්‍රදේශයට ස්ථාන මාරු ලබා පැමිණෙන අවස්ථාවන්හි දී එම නිලධාරීන්ගේ දරුවන්ට 6 ශ්‍රේණිය සඳහා ශිෂ්‍යත්ව විභාග ලකුණු පාදක කොට පුරප්පාඩු අනුව පාසල් ලබාදෙනු ඇත.

(අ) එසේ නොවන අවස්ථාවන් හි දී අවම ලකුණු සීමාවන් තීරණය නොවූ පුරප්පාඩු සහිත පාසල්වලට ඇතුළත් කළ හැකිය.

(ආ) යම් තැනැත්තෙක් විදේශයන්හි සේවය කර මෙරටට පැමිණ 6 වන ශ්‍රේණියට ඇතුළත්වීම සඳහා ඉල්ලුම් කරන අවස්ථාවක දී පහත සඳහන් කරුණු පිළිබඳ ව සැලැකිල්ලට ගත යුතු වේ.

1. අදාළ සිසුවා / සිසුවිය විදෙස් ගතවීමට පෙර මෙරට පාසලක ඉගෙනුම ලබා ඇත් ද යන වග හා එසේ අධ්‍යාපනය ලබා තිබේ නම් එම පාසලට හෝ ඒ හා සමාන පාසලකට පුරප්පාඩු ඇත්නම් ඇතුළත්වීමට අවස්ථාව සැලසීම.

11. මෙරට පාසලක දී අධ්‍යාපනය ලබා නොමැති විටක දී අදාළ දරුවාගේ දැනුම මෙරට 6 වන ශ්‍රේණියේ දැනුමට සමාන වන බව අවම ලකුණු සීමාවන් තීරණය නොවූ විදුහලේ විදුහල්පති විසින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව එම විදුහල්වලට පුරප්පාඩු ඇත්නම් පමණක් ඇතුළත් කිරීමට ඉඩකඩ සලසාදීම.

(ඇ) **5 වන ශ්‍රේණිය දක්වා පමණක් පන්ති ඇති පාසල්වල 5 වන ශ්‍රේණිය සමත් වන සියලු ම සිසුන්ට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් විකල්ප පාසල් ලබා දිය යුතු ය.**

## 5.0 පොදු කරුණු

(අ) පිළිගත හැකි හේතුවක් නොමැති ව ජාතික පාසලකින් ජාතික පාසලකට ළමයින් ඇතුළත් නොකළ යුතු ය. (5 ශ්‍රේණි ශිෂ්‍යත්වධාරීන් හැර) මේ සම්බන්ධයෙන් යම්කිසි පාසලක ශිෂ්‍යයෙකුට හෝ ශිෂ්‍යාවකට හෝ අසාධාරණයක් වන්නේ යැයි අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නිගමනය කළ අවස්ථාවක දී ඒ පිළිබඳ ව සුදුසු පරිදි තීරණයක් ගැනීමේ බලය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

(ආ) ත්‍රස්තවාදී ක්‍රියා හේතු කොට ගෙන හෝ ස්වාභාවික ව්‍යසනයක් හේතු කොට ගෙන අවතැන් වූ පවුල්වල දරුවන් පාසල්වලට ඇතුළත් කිරීමේ දී උප්පැන්න සහතික, අස්වීමේ සහතික ආදිය ද නොමැති වූ විට, එකී පවුල් ත්‍රස්තවාදී ක්‍රියාවලට භාජන වූ බවට/ස්වාභාවික ව්‍යසනයකට පත්වූ බවට ග්‍රාම නිලධාරී සහතිකය, අනාථ කඳවුරු සහතිකය ආදිය සලකා බලා සුදුසු පරිදි අදාළ ශ්‍රේණියට ඇතුලු කර ගැනීමට කටයුතු කළ යුතු ය. උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ නොහැකි අවස්ථාවන්හි දී උපන්දිනය සනාථ කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක් ලබා ගත හැකිය ය. එහෙත් පසුව උප්පැන්න සහතිකය ලබා ගත යුතු ය.

(ඇ) විධිමත් ලෙස පාසල්වලට ඇතුළත් නොවූ පාසල් යායුතු වයසේ ළමයින් හා නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන යටතේ සාක්ෂරතා පන්තිවලට සහභාගි වී සාක්ෂරතා කුසලතා ලැබූ ළමයින් ඔවුන්ගේ වයස හා ප්‍රවීණතාව සලකා සුදුසු පන්තිවලට ඇතුළත් කර ගැනීමට හැකි ය. සාක්ෂරතා පන්තිවලට හෝ වෙනත් පාසලකට නොගියත් විදුහල්පති ඇතුළු මණ්ඩලයක් මගින් ළමයා සතු දක්ෂතා පරීක්ෂා කර බලා පුරප්පාඩු අනුව ඇතුළු කිරීමට කටයුතු කළ යුතුය. එවැනි ශිෂ්‍යයින්

සඳහා උප්පැන්න සහතිකය නැතහොත් ඒ වෙනුවට දිවුරුම් පෙත්සමක් පිළිගත හැකිය. එසේ වුවත් පසුව උප්පැන්න සහතිකයක් ලබාගත යුතුය.

(ඈ) රජයට පවරා ගන්නා පාසල්වල පුරප්පාඩු පිරවීමේදී පවරා ගන්නා අවස්ථාවේ තත් පාසලේ සිටි ආගමික සිසු අනුපාතය ගැන සැලකිලිමත් විය යුතුය. යම් ආගමික එක් කොටසකට වෙන් කරන ලද ප්‍රමාණයට අඩු අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඇති කල්හි එම පුරප්පාඩු සෙසු ආගමික කොටස් අතර, අනුපාතිකව බෙදා හැරිය යුතුය.

## 6.0 ළමයින් ඇතුළත් කිරීම සඳහා මුදල් සහ වෙනත් ආධාර ලබා ගැනීම තහනම් කිරීම.

සියලු ම රජයේ පාසල් හා ගාස්තු අය නො කරන පෞද්ගලික පාසල්වලට ළමයින් ඇතුළත් කිරීමේ දී පහසුකම් හා සේවා ගාස්තු සහ පාසල් සංවර්ධන සමිති සාමාජික මුදල හැර වෙනත් ගාස්තු හෝ ආධාර මුදල් හෝ වෙනයම් බඩු බාහිරාදියක් හෝ අයකිරීම/ලබාගැනීම සම්පූර්ණයෙන් ම තහනම් වේ. ළමයින් ඇතුළත් කිරීමෙන් පසුව ද එවැනි බලපෑමක් නො කළ යුතු වේ. මෙලෙස බලපෑම් කිරීම සම්පූර්ණයෙන් ම නීති විරෝධී වන අතර එවැනි අවස්ථාවල ඒ සම්බන්ධ ව දැඩි ලෙස ක්‍රියා කිරීමට සිදු වනු ඇත. පාසල් ප්‍රධානීන් හෝ පාසලට සම්බන්ධ වෙනත් කවර සංවිධානයක් හෝ එලෙස බලපෑම් නොකළ යුතු ය. මෙහි දී සංවිධාන යන්නෙන් ආදි ශිෂ්‍ය සංගම්, පාසල් සංවර්ධන සමිති ඇතුළු පාසලට සම්බන්ධ වූ සියලු ම සමිති හා සංගම් අදහස් කෙරේ.

මෙම චක්‍රලේඛයෙන් පැන නගින ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

එම්.එම්.එන්.ඩී.බණ්ඩාර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :
1. ජාතික අධ්‍යාපන කොමිසම් සභාවේ සභාපති
2. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
3. විභාග කොමසාරිස් ජනරාල්
4. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
5. විගණකාධිපති
6. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම මාණ්ඩලික නිලධාරීන්
7. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම ශාඛා ප්‍රධානීන්

උපලේඛන අංක 01

**පාසල්වල 2 වන ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා (6 ශ්‍රේණිය හැර)**
**පන්තිවලට සිසුන් ඇතුළත් කිරීමේ අයදුම්පත්‍රය**

. . . . . . . . . . . . . . . . . . . වර්ෂයේදී . . . . . . . . . . . . . . . . . . . . . . . . විද්‍යාලයේ

. . . . . . . . . . . . ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය

(01). ළමයා පිළිබඳ විස්තර :-

1.1 සම්පූර්ණ නම : (වාසගමට යටින් ඉරක් අඳින්න)
1.2 ස්ත්‍රී/ පුරුෂ භාවය :
1.3 අධ්‍යාපන මාධ්‍යය :
1.4 ආගම
1.5 උපන් දිනය :
1.6 200 . . . වර්ෂයේ ජනවාරි 31 වන දිනට වයස අවු . . . . . මාස . . . . දින . . .
1.7 දැනට ඉගෙනුම ලබන පාසල හා ශ්‍රේණිය :

(02). මව/පියා/ භාරකරුවන් පිළිබඳ විස්තර :

2.1 සම්පූර්ණ නම :
2.2 ජාතික හැඳුනුම්පත් අංකය :
2.3 ස්ථිර ලිපිනය :
2.4 දැනට පදිංචි වී සිටින ස්ථානයේ ලිපිනය :
(දරුවා හා පවුලේ අනෙකුත් සාමාජිකයන් සමඟ පදිංචිව සිටිය යුතුය)
2.5 දැනට පදිංචි වී සිටින ස්ථානයේ ග්‍රාමසේවා කොට්ඨාසය :
2.6 පෙර පදිංචි වී සිටි ස්ථානයේ ලිපිනය :
2.7 පදිංචිය වෙනස් කිරීමට හේතු :
2.8 ස්ථාන මාරුවීමක් නම් ස්ථාන දෙක අතර දුර :
2.9 පදිංචිය වෙනස් කර ඇත්නම් පදිංචි ස්ථාන දෙක අතර දුර :
2.10 විදේශගත සිට පැමිණි අය තම දරුවා සමඟ විදේශගත වී සිටි කාලය :

(03). දරුවා ජාතික මට්ටමේ ජයග්‍රහණ ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර :

(04). 5 ශ්‍රේණි ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි වර්ෂය හා ලබාගත් ලකුණු :
( 6 සිට 11 ශ්‍රේණි සිටින සිසුන් සඳහා පමණි )

(05). කැමැත්ත හා ළඟාවීමේ පහසුව අනුව තව පාසල් 04 ක් නම් කරන්න.

| | පාසල | ලිපිනය |
|---|---|---|
| i. | | |
| ii. | | |
| iii. | | |
| iv. | | |

(06). වෙනත් අදාළ විස්තර :

(07). ප්‍රකාශය :

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව ද , එම තොරතුරු තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලිපි ලේඛණ සත්‍ය බව ද සහතික කරමි. මවිසින් සඳහන් කරන ලද යම් තොරතුරක් අසත්‍ය බව හෙළි වුවහොත් මගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලබන බව මම දනිමි. ළමයා පාසලට ඇතුළත් කළ පසු එම තොරතුරු අසත්‍ය බව හෙළිවුවහොත් ඔහු/ඇය පාසලෙන් ඉවත් කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කෙරෙන ප්‍රදේශයේ වෙනත් පාසකට ඇතුළත් කිරීමට මම එකඟ වෙමි.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

දිනය : මව/පියා/නීත්‍යනුකූල භාරකරුගේ අත්සන

(ඉහත කී කරුණු සනාථ කිරීම සඳහා අදාළ ලිපිලේඛන සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු ය.)